# 16 බොරු සාක්ෂි නොකියව

හිරාන් තම අධ්‍යාපන කටයුතු අතර මග දී කඩාකප්පල් කරගත් විසිවන වියේ තරුණයෙකි. පාසල් අවධියේ සිට ම විවිධ දුරාචාරයනට ඇබ්බැහි වූ නිසා මුදල් අවශ්‍යතා ඔහුට තදින් ම දැනිණි. ඒ වෙනුවෙන් ඕනෑ ම දෙයක් කිරීමට ඔහු ඉදිරිපත් විය.

ඔහු වකුගඩු රෝගීන්, දරුණු රෝගාබාධයන්ගෙන් පෙළෙන රෝගීන් වාහනයක දමා බොහෝ දුර පළාත්වලට ගොස් ඔවුන් ව පෙන්වා මුදල් එකතු කළේ ය. ඇතැම් දිනවල රෝගීන් නොමැති ව ඔවුන්ගේ වෛද්‍ය වාර්තා දවසේ කුළියට මිලට ගෙන ගමින් ගමට ගියේ ය. කාලයක් තිස්සේ බොරු කියමින් සිඟමනේ ගිය හිරාන් බලාපොරොත්තු නොවූ ආකාරයට ඔහුගේ කපටි ක්‍රියාව දිනක් පොලිසියට හසුවිය. අනුන් රැවටීමට උපන් හපනෙකු වූ හිරාන්ට පොලිස් නිලධාරීන් රැවටීමට එදින නොහැකි විය.

(2014.12.21 ලංකාදීප පුවත්පතෙන් උපුටාගත් සත්‍ය සිදුවීමක් ඇසුරිනි)

"ඇත්ත කියන්නත් බිම ඉඳගන්නත් ඇයි බිය වෙන්නේ" හා "පැත්ත ගියත් ඇත්ත කියමු". යනාදි කියමන් සත්‍යගරුක බව අවධාරණය කරයි. එපමණක් නොව සත්‍යවාදී ලෙස දිවි ගෙවන අයට සමාජය ගරු කරයි. දෙබිඩි ජීවිත ගත කරන අය සමාජය පිළිකුල් කරයි. දස පනතේ, අටවන පනතින් සත්‍යය ප්‍රකාශ කිරීමටත් සත්‍යවාදී ව ජීවත් වීමටත් උගන්වයි. එලෙස ම ප්‍රසාද ස්නාපනීය කැඳවීම තුළින් දේව දරුවන් ලෙස "සත්‍යය" වූ දෙවියන් වහන්සේ අනුගමනය කිරීමටත්, සත්‍යගරුක ව දිවි ගෙවීමටත් කැඳවනු ලබයි.

ශුද්ධ බයිබලයට අනුව ද බොරු කීම බරපතළ පාපයකි. එබැවින් ශුද්ධ වූ සභාවට බොරු කියූ අනනියස් හා සපිරා ව හදිසි මරණයකට ගොදුරු විය (ක්‍රියා 5:1-11). දස පනතේ අටවන පනතින් ද එය තහනම් කරන්නේ මෙලෙසිනි.

නුඹේ අසල්වැසියාට විරුද්ධ ව බොරු සාක්ෂි නොකියව.
(නික්මයාම 20:16)

නුඹේ අසල්වැසියාට විරුද්ධ ව බොරු සාක්ෂි නොකියන්න.
(ද්විතීය 5:20)

මේ අනුව දස පනතින් අසල්වැසියාට විරුද්ධ ව බොරු සාක්ෂි නොකිය යුතු බව උගන්වයි. තව ද දිවුරුම් කඩ නොකර ස්වාමීන් වහන්සේට දුන් දිවුරුම ඉටු කළ යුතු බව සිහි ගන්වයි.

ජේසුස් වහන්සේගේ ඉගැන්වීම් අනුවත් බොරු කීම මිනිසා කෙලසනු ලැබීමට හේතුවන බව අවධාරණය කරයි.

මිනිසා කෙලෙසනු ලැබීමට හේතු වන්නේ කටට ඇතුළු වන දේ නොව, කටින් නික්මන දේ ය. කටින් පිටවන දේ නික්මෙන්නේ සිතින් ය. මිනිසා කෙලෙසනු ලබන්නේ එයින් ය. නපුරු චේතනා, මිනීමැරුම්, කාමරාග, සල්ලාලකම්, සොරකම්, බොරු සාක්ෂි හා අපහාස නික්මෙන්නේ හදවතින් ය. මිනිසා කෙලසනු ලබන්නේ මෙකී දේවලිනි.
(මතෙව් 15:10-20)

ඉහතින් දක්වා ඇති ශුද්ධ බයිබලීය පාඨවලට අනුව බොරු සාක්ෂි කීමට මුල්වන "සිතුවිලි" ගැන කතා කරයි. බොරු සාක්ෂි කීමට අප යොමු කරන්නේ "සාතන්" හෙවත් "නපුරේ බලවේගය" බව පහත පාඨය පෙන්වා දෙයි.

ඔබේ පියා යක්ෂයා ය. එබැවින් ඔබේ කැමැත්ත ඔබේ පියාගේ ආශාවන් ඉටු කිරීම ය. මුල සිට ම ඔහු මිනීමරුවෙකි. සත්‍යය ඔහු තුළ පිහිටා නැති බැවින්, ඔහු සත්‍යයෙහි නොපිහිටියේ ය. ඔහු බොරු කියන කල ඔහුගේ නියම ගතියෙන් ම කතා කරයි. මන්ද, ඔහු බොරුකාරයෙකි. ඔහු බොරුවේ පියා ය.
(ජොහන් 8:44)

තව ද, ශුද්ධ වූ පාවුලු තුමා, එපීස ලිපියෙන් බොරු කීම අත්හැර දමා සත්‍යය කතා කළ යුතු බව අවධාරණය කරයි.

බොරුකීම අත්හැරදමා අසල්වාසි එකිනෙකා සමග සත්‍යය කතා කරන්න. මන්ද, අපි එකිනෙකා අන්‍යෝන්‍ය අවයවයෝ වෙමු.

(එපීස 4:25)

කතෝලික සභා ධර්මෝපදේශය අනුව අසල්වාසීන් සමග අපේ සම්බන්ධතාවල දී සත්‍යය විකෘති කිරීම අටවන පනතට විරුද්ධ බව පෙන්වා දෙයි. එසේ ම පරම සත්‍යය වූ මහෝත්තම දෙවියන් වහන්සේට සාක්ෂි දැරීමට නම් වචනයෙන් හා ක්‍රියාවෙන් අවංක විය යුතු බවත්, හෘද සාක්ෂියේ සදාචාරාත්මක නීතිය අනුගමනය කළ යුතු බවත් පෙන්වයි.

අසල්වාසීන් සමග අප පවත්වන සම්බන්ධතාවල දී සත්‍යය විකෘති කිරීම අටවන පනතින් තහනම් කෙරේ. වචනයෙන් හෝ ක්‍රියාවෙන් හෝ සත්‍යයට එරෙහිව නැඟීසිටීම, හෘද සාක්ෂියත්, සදාචාරාත්මක අවංකභාවයත් ප්‍රතික්ෂේප කිරීමකි. මෙය මූලික වශයෙන් දෙවියන් වහන්සේට ද්‍රෝහිවීමක් ද වේ.

(ක.ස.ධ. 2464)

හෘද සාක්ෂිය දේව හඬ යි.
සැම විට ම එයට සවන් දී
ජීවත් වන්න.

එබැවින්, ප්‍රසාද ස්නාපනීය කැඳවීම තුළ අපගේ දේව පුත්‍රභාවය පිළිගනිමින් සත්‍ය ගරුක සමාජයක් බිහි කරනු සඳහා අපි සැවොම කැප විය යුතු වෙමු.

සත්‍යගරුක සමාජයක් ගොඩනැංවීමට ඔබට බොහෝ දේ කළ හැකි ය.

**මට කරන්න පුළුවන්**

- සැම විට ඇත්ත කථා කිරීම
- අවංක වීම
- අසත්‍ය තොරතුරු ප්‍රචාරය නොකිරීම
- මා නොදන්නා දේවල් හා පුද්ගලයන් ගැන කතා නොකිරීම

## ක්‍රියාකාරකම

පවුල, පාසල, මීසම හා සමාජය තුළ සත්‍යගරුක සමාජයක් ගොඩනැගීමට ඔබට දයක විය හැකි ආකාර දෙමව්පියන් සමග සාකච්ඡා කර පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න.

| නිවසේ දී කළ හැකි දෑ | පාසලේ දී කළ හැකි දෑ | මීසම තුළ කළ හැකි දෑ | සමාජය තුළ කළ හැකි දෑ |
|---|---|---|---|
| 1. ................. | 1. ............... | 1. ............... | 1. ............... |
| 2. ................ | 2. ............. | 2. ............. | 2. ............... |
| 3. ............... | 3. ............. | 3. ............. | 3. ............... |
| 4. ............. | 4. ............. | 4. ............. | 4. .............. |
| 5. ............. | 5. ............ | 5. ............. | 5. .............. |



**ජීවිතයට බිඳක්**

***සැම විට ම සත්‍යය කතා කරන්න. ඒ අනුව ජීවත් වන්න.***